# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : **2556629** ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk

මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැනැර/126/19 ඔබේ අංකය :

2019.07.30

සී.ඩී. වික්‍රමරත්න මහතා,
වැඩබලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

<u>ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධි පාඨමාලාව සම්බන්ධව.</u>

ඉහත විශ්ව විද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලබන නීතිවේදී උපාධි පාඨමාලාව සඳහා පවත්වන ලද තරග විභාග වලින් අනතුරුව පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් 10 දෙනෙකුට ශිෂ්‍යත්ව පිරිනමන ලද අතර, 2013 වර්ෂයේදී ඔවුන් එම පාඨාමාලාව සඳහා ඇතුලත් වී 2016 වර්ෂය අගදී පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇත. ත්‍රිවිධ හමුදාව, පොලිසිය සහ සිවිල් ශිෂ්‍යයන්ගෙන් සමන්විත වූ 2013 වර්ෂයේ ඇරඹි පාඨමාලාවේ විශිෂ්ඨතම විද්‍යාර්ථියාට හිමි සම්මානය දිනාගනිමින් එම කණ්ඩායමේ පොලිස් පරීක්ෂක වරයෙකු විසින් ශ්‍රී ලංකා පොලිසිය වෙත විශාල කීර්තියක් අත්කර දෙමින් පාඨමාලාව සාර්ථකව නිමා කර ඇත.

එසේ හෙයින් නීතිවේදී උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් හට අනගි අවස්ථාවක් ලැබී තිබුණි. මෙම උපාධි පාඨමාලාව සඳහා 2013 වර්ෂයට පසු වර්ෂයන් වලදී පුරප්පාඩු වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා පොලිසිය වෙත ලබාදුන්නද ඒ සඳහා විශ්ව විද්‍යාලය වෙත ඇතුලත් වූයේ 2014 වර්ෂයේදී තිදෙනෙක්ද, 2016 වර්ෂයේදී හය දෙනෙක්ද වශයෙන් ඉතා අඩු ප්‍රමාණයකි. 2016 වර්ෂයෙන් පසු කිසිදු නිලධාරියෙකු මෙම පාඨමාලාව සඳහා යොමුකර නැත. පොලිස් නිලධාරීන් නීති වේදී උපාධිය හිමි කර ගැනීම සහ ඉන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයින් වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව ඔවුන්ගේ රාජකාරී කටයුතු , අධිකරණයේ නඩු මෙහෙයවීම් කටයුතු ඉතාමත් විශ්වාසයෙන් යුතුව ඉටුකිරීමට හැකිවනු අතර, අධිකරණ නිලධාරීන්ගේ සහ සෙසු නීතිඥ වෘත්තියේ නියැලෙන්නන්ගේද නිසි ඇගයීමකට ලක්වනු ඇත. ඒ තුලින් ශ්‍රී ලංකා පොලිසියේ කීර්ති නාමය ඉහල නැංවීමට පාදක වන බව අප සංගමයේ විශ්වාසයයි.

නීතිය හා සාමය සුරක්ෂා කිරීමට නෛතිකව බැඳී සිටින පොලිස් නිලධාරීන් හට නීතිය සම්බන්ධව ශාස්ත්‍රීයමය දැනුම අත්‍යාවශ්‍ය සාධකයක් බව ප්‍රත්‍යක්ෂ කරුණකි.

කරුණු මෙසේ හෙයින් මේ සම්බන්ධව ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකර දැනට නවතා ඇති නීති වේදී උපාධි පාඨමාලාව සඳහා ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වෙත නිලධාරීන් යොමුකිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නෙමු.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

එස්. සංජය පෙරේරා,
පොලිස් පරීක්ෂක,
සභාපති,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.
ගරු සභාපති
පොලිස් පරීක්ෂක සංගමය

ප්‍රගීත් ප්‍රේමසිරි,
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.
ගරු ලේකම්
පොලිස් පරීක්ෂක සංගමය